# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශේෂ

අංක 14,724/4 — 1966 දෙසැම්බර් 4 වැනි ඉරිද — 1966.12.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය අංක 61/9/262

ආදායම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1966 දෙසැම්බර් 5 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ :—

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... | 0 95 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 02 |

අංක ඒ. 781,
1966 දෙසැම්බර් 3 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

---

### රේගු දැන්වීම—අංක 64/5/122

1964 අගෝස්තු මස 8 වැනි දින අංක 14,158 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනවූ ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1966 දෙසැම්බර් මස 5 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 166 3/10 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල් තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත දැක්වෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | | අමු පොල් ගෙඩි 1,000කට සඳහා අපනයන තීරුව රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 180 93 | ... | 107 14 | ... | 90 99 | ... | 45 23 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඒ. 744/22,
1966 දෙසැම්බර් 3 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

998/9—ආර් ආර් 19449—11,300 (66/11)